12

# වැස්ස



1. වලාකුළේ රන් පාටට
විදුලි කොටනවා
ආකාසේ හඬ තළමින්
අකුණු හඬනවා

2. බිංදු බිංදු මහ පොළොවට
වතුර වැටෙනවා
හෝ ගාමින් අපේ ගමට
වැස්සක් එනවා

3. වැස්ස වහිනවා
අකුණු හඬනවා
රන් පාටට අහස පුරා
විදුලි කොටනවා

4. රැන් රැන් වහලෙ දිගේ
වැස්ස වහිනවා
කිරි පාටට බුබුළු බුබුළු
මිදුලෙ නටනවා

5. අපේ මිදුලෙ ගඟක් වෙලා
වතුර ගලනවා
කඩදහි ඔරු දිය පාරේ
රුවල් බඳිනවා

***ඩබ්. ඒ. අබේසිංහ***
***- ගී සින්දු -***

## අවබෝධය සහ රස විඳීම

1. මේ කවි පෙළ ගායනා කරන්න.
2. වැස්සක් ඇති වීමට ආසන්න බව පෙන්වන ලකුණු කීපයක් මෙම කවි පෙළෙහි සඳහන් වෙයි. ඒවා මොනවා ද?

3. එක් එක් කවියෙන් කියවෙන දේ ඔබේ වචනයෙන් විස්තර කරන්න.

4. අවසාන කවියෙහි වහින විට කුඩා ළමයින් කරන ක්‍රියාවක් ගැන කියවෙයි. එය කුමක් ද?

5. මෙම කවි පන්තියෙහි එක තැන දෙවරක් කියැවෙන වචන කීපයක් ඇත. ඒවා සොයා ශබ්ද නඟා කියන්න. ඉන් පසු ලියන්න. උදා:- බිංදු බිංදු

6. ඔබ වඩාත් ම ප්‍රිය කරන කවිය තෝරා එය පැහැදිලි අත් අකුරින් ලියන්න.

## භාෂා ක්‍රියාකාරකම්

7. සමාන තේරුම ගෙන දෙන වචන ලියන්න.

i. වැස්ස .........  ii. හඬ ..........

iii. පොළොව .............  iv. ගහ ..........

v. පාට ...........

8.'නැත' යන අර්ථය හඟවමින් මෙම ක්‍රියා පද නැවත ලියන්න.
උදා:- හඬයි - නොහඬයි

i. ගලයි ....................  ii. වැටෙයි ....................

iii. තෙමෙයි ..................  iv. එයි ....................

v. බඳියි ....................  vi. කරයි ....................

9.සුදුසු ක්‍රියා පද වරහන් තුළින් තෝරා ලියන්න.

i. අහස අඳුරු .....................

ii. ගොරවන ශබ්දය ...............

iii. වතුර බුබුළු මිදුලේ හැම තැන දකින්නට .................

iv. කඩදසි ඔරු .....................

v. මිදුල වැහි වතුරෙන් .................

(ඇසෙයි ලැබෙති ලැබෙයි වෙයි
ඇසෙති පිරෙයි පාවෙයි පාවෙති)

10. ගැළපෙන වචන තෝරා හිස් තැන් පුරවන්න.

i. වැස්ස ස්වල්පයක් වත් නොමැති කාලය ..............................

ii. ඝන බවට පත් ජලය ............................

iii. ගඟක් මුහුදට වැටෙන ස්ථානය ........................

iv. බීමට සුදුසු ජලය ......................

v. උෂ්ණත්වය නිසා ජලය වාෂ්ප බවට හැරීම .................

(මීදුම, වාෂ්පීකරණය, නියඟය, පානීය ජලය, හිම, මෝය)

11. ගුවන්විදුලි ගීතයක කොටසක් පහත දක්වෙයි.

අක්කෙ අක්කෙ අර බලන්නකෝ
වැස්සක් නොවැ එන්නේ
හෝ හෝ හෝ ගාගෙන එන්නේ
ගස් ගල් පෙරළෙන්නේ
සුළං තදයි විදුලිය ද කොටයි
හෙණ හඬ පැතිරෙයි
මහ වලාකුළක් මේ එන්නේ

පද මාලාව - **ආනන්ද සමරකෝන්**

මෙම ගීතයේ දැක්වෙන අදහස් සහ කවි පෙළෙහි අදහස් එකතු කරමින් ''වැස්ස'' ගැන රචනයක් ලියන්න.

## පැවරුම්

1. කෙසෙල් පිති සහ ඉරටු යොදා කොල්ලෑව සහිත සෙල්ලම් ඔරුවක් සාදන්න. එය දියෙහි පා කර හරින්න.

2. ඔබේ ප්‍රදේශයේ ගෙවල් සිය ගණනක් ගංවතුරින් යට වී ඇතැයි සිතන්න. ගංවතුරින් අනාථ වූවන්ට අවට ප්‍රදේශවලින් ආධාර එකතු කිරීම සඳහා වාහනයක් සූදානම් කර ඇත. එහි සවි කළ ශබ්ද විකාශන යන්ත්‍රයෙන් ප්‍රචාරය කළයුතු ප්‍රකාශය ලියන්න. එය හඬ නඟා කියන්න.

3. බිංදු බිංදු මහ පොළොවට

   වැස්ස වැටෙනවා

   i. ඔබේ වචන යොදමින් කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

   ii. 'වැස්ස' ගැන කවි කීපයක් නිර්මාණය කරන්න.